# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,808 - 2013 අප්‍රේල් මස 26 වැනි සිකුරාදා - 2013.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 584 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 593 |


*සැ. යු.* - (i) රේගු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### උප පොලිස් පරීක්ෂක තනතුර (රජ්‍ය බුද්ධි සේවාව)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය බුද්ධි සේවාවට සෘජුවම ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2013.06.25 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය :*

රු. 1,90,200 - 7 x 2,160 - 2 x 2,880 - 8 x 3,840 - 17 x 4,500 - රු. 3,18,300

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) *විශේෂ දුෂ්කර දීමනා :*

(1) දුෂ්කර දීමනා සඳහා රු. 2,000

(ආ) සංයුක්ත දීමනා :

(1) මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 12,000
(2) මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 9,600

(ඇ) වෙනත් දීමනා :

(1) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව රු. 250
(2) සිවිල් ඇඳුම් දීමනාව රු. 200
(3) දිරි දීමනාව රු. 1,500
(4) මූලික වැටුපෙන් 1/4 වන දීමනාව

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරී සඳහා ගමන් වියදම් දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

(ඊ) තෝරා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය ඇඳුමින් සැරසි රාජකාරි කළ යුතු අතර මෙරට හා පිටරට පුහුණුව ලැබීමට සුදානම් විය යුතුය.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

(අ) *වයස් සීමාව :*
*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට* වයස අවුරුදු 18-28 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට හා ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් :*

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත්ව එම විෂයයන් 04ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර ඉන් 02ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතුය.

* අයදුම්කරු අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03ක් සමත්වීම.

*සටහන 01* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම් :*

* *උස අඩි 05 යි. අඟල් 06 යි. (අවම),*
* පපුව අඟල් 32 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඉ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .—* එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම් :*

* අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් නිලධාරින්ට සහ පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

  මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 14.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

  * *වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.*—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.

  * *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.*—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය :*
ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය :*

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :—*

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි :—*

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

10. *සේවා කොන්දේසි :—*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි

වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

(උ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

පොලිස්පති.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*පොලිස් දෙපාර්තමේන්තුව*

*ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර (රජ්‍ය බුද්ධි සේවාව)*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :———.

(ආ) නම (මුලකුරු සමග) :———.

(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාල පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :———.

06. (අ) ජාතිය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස :— (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.

පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———.
(ආ) ———.

15. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද ? :———.

(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :———.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න. :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

21. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/ මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :———.

දිනය :———.

11-672/1

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

පොලිස් කොස්තාපල් තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය බුද්ධි සේවාවට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2013.06.25 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) දුෂ්කර දීමනා සඳහා රු. 2,000

(ආ) *සංයුක්ත දීමනා :*

| | |
|---|---|
| (1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා | රු. 10,500 |
| (2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා | රු. 8,400 |

(ඇ) *වෙනත් දීමනා :*

| | |
|---|---|
| (1) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | රු. 250 |
| (2) සිවිල් ඇඳුම් දීමනාව | රු. 200 |
| (3) දිරි දීමනාව | රු. 1,500 |
| (4) ආරම්භක වැටුපෙන් 25% වන දීමනාව | |

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරී සඳහා ගමන් වියදම් දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

(ඊ) තෝරා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය ඇඳුමින් සැරසී රාජකාරි කළ යුතු අතර මෙරට හා පිටරට පුහුණුව ලැබීමට සුදානම් විය යුතු ය.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

(අ) *වයස් සීමාව :*
*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට* වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට පොලිස් ආරක්ෂක සහායක සේවාවේ නියුතු නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් :*

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතු ය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

*සටහන 01* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) ශාරීරික සුදුසුකම් :

* *උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),*
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

සටහන : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඉ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .*— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම් :*

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 14.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් හෝ දරාගැනීමේ පරීක්ෂාව සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

  * *වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය* විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.

  * *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය* පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය :*
ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය :*

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි :*

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි :*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

*පොලිස්පති.*

***පොලිස් දෙපාර්තමේන්තුව***

*ආධුනික පොලිස් කොස්තාපල් තනතුර (රාජ්‍ය බුද්ධි සේවාව)*

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :————.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ මැතිවරණ කොට්ඨාසය :————.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(උ) දුරකතන අංකය - නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස :— (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————.අඟල් :————. පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතු ය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ————,
(ආ) ————.

15. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේ ද ? :———.

(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :———.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න. :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

04-672/2

**සංශෝධනයයි**

තක්සේරු දෙපාර්තමේන්තුව

2013.04.19 දිනැති අංක 1807 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස ඃ II(අ) වැනි ඡේදය - පළකිරීම් හි තනතුරු - ඇබෑර්තු යටතේ පළකරන ලද නිවේදනයේ අවසානයට අයදුම්පත්‍රය පළ වී නොමැත.

එම අයදුම්පත්‍රය පහත පළ වේ. ඃ-

ආර්. ඒ. ආර්. එම්. එන්. රාජකරුණා,
රජයේ ප්‍රධාන තක්සේරුකරු.

තක්සේරු දෙපාර්තමේන්තුව,
අංක 748, මරදාන පාර,
කොළඹ 10.

**ආදර්ශ අයදුම් පත්‍රය**

( අයදුම් පත්‍රය පහත සඳහන් පරිදි පිළියෙල කළ යුතු ය.)

***තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය***

01. අයදුම්කරුගේ නම ඃ

1.1 මුලකුරු සමග නම :———.

1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන් /දෙමළෙන්)

02. පෞද්ගලික ලිපිනය :
(සිංහලෙන් /දෙමළෙන්) :———.
(ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහාම දැන්විය යුතු ය)

03. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය ඃ
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :———.
සිංහලෙන් /දෙමළෙන් :———.

04. ස්ත්‍රී පුරුෂ භාවය ඃ පුරුෂ ඃ ☐
(පුරුෂ 01, ස්ත්‍රී 02 ) ස්ත්‍රී ඃ ☐

05. ඔබ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍ය ඃ
සිංහල සහ ඉංග්‍රීසි - 1
දෙමළ සහ ඉංග්‍රීසි - 2 ☐

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :———.

07. ජාතික හැඳුනුම්පත් අංකය :

08. උපන් දිනය :

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

8:1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

| අවුරුදු | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

09. (1) වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් :————.

(11) දෙවන භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :————.

(111) පළමු භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :————. (අ.පො.ස (සා.පෙළ)/(උ.පෙ) විභාගවලින් නම් වර්ෂය හා ඔබ ලැබූ ශ්‍රේණිය (සම්මාන/විශිෂ්ට) සඳහන් කළ යුතු වේ.)

(iv) (1) උපාධි සුදුසුකම් :

| *උපාධිය* | *විෂයයන්* | *සාමාර්ථය (පංතිය)* | *වර්ෂය* | *විශ්වවිද්‍යාලය* |
|---|---|---|---|---|
| | | | | |

(11) පශ්චාත් උපාධි සුදුසුකම් :

| *පශ්චාත් උපාධියේ නම* | *උපාධිය පිරිනමන ලද වර්ෂය* | *විශ්වවිද්‍යාලය* |
|---|---|---|
| | | |

(v ) නීතිඥ වෘත්තියේ පළපුරුද්ද :————.

10. අධිකරණය ඉදිරියේ ඔබ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද ?
ඔව් / නැත

ඔව් නම් ඒ පිළිබඳ විස්තර සපයන්න :————.

11. *අයදුම්කරුගේ සහතිකය :*

(*අ*) මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත්, මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. (i) *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මහතා/ මහත්මිය /මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2013............ මස............ දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

12. (ii) *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

අයදුම්කරු/අයදුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, නිවැරදි බවත් ඔහුගේ/ ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් මෙම තනතුර සඳහා තෝරාගත හොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.

දිනය :————.

04-856

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2013
(කෘෂිකර්ම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2014/2016)

2014/2016 දැවුරුදු කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2013 ජූලි මස 27 වැනි දින ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. *කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව :*

2.1 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇත. මෙම පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හා 6 මට්ටම ලබාදීමට යෝජිතය

2.2 කෘෂිකර්මය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්‍ෂයටම විවෘත වන අතර, මෙම විභාගයෙන් හා පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයෙන් සුදුසුකම් ලැබූ අය කුසලතා හා දිස්ත්‍රික් පදනම මත අඟුණකොළපැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරාගනු ලැබේ. අඟුණකොළපැලැස්ස, කරපිංච, පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයන්හි සිංහල මාධ්‍යයෙන් ද, වවුනියාව කෘෂිකර්ම විද්‍යාලයෙහි දෙමළ මාධ්‍යයෙන් ද, කුණ්ඩසාල කෘෂිකර්ම විද්‍යාලයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද මෙම පාඨමාලාව පැවැත්වේ.

2.3 මෙය පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවකි. එබැවින් මෙම පාඨමාලාව හදාරන කාලය තුළ දී නේවාසිකව සිටීම අනිවාර්ය වේ.

03. *පාඨමාලාව සඳහා ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ යන විෂයයන් තුනෙන් එකකටවත් සම්මාන සාමාර්ථයක් ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙ.) සමත් වී තිබිය යුතුය. මෙහි දී එක් වරක දී විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් සමත්වී තිබීය යුතුය ;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් තුනක් එකවර සමත්වී තිබිය යුතුය. (පාඨමාලාවට තෝරා ගැනීමේ දී මෙම සුදුසුකම් ඇති සිසුන්ට දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.);

*හෝ*

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ යන විෂයයන් තුනෙන් එකකටවත් සම්මාන සාමාර්ථය ක් ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් අ. පො. ස. (සා. පෙළ) සමත්වී තිබිය යුතුය. මෙහි දී එක්වරක දී විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් සමත් වී තිබීය යුතුය ;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් විෂයයන් එකක් හෝ දෙකක් සමත්වී තිබිය යුතුය. (උසස් පෙළ සඳහා ගණිතය විෂයය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී සිටීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.) මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ යම් දිස්ත්‍රික්කයකින් කෘෂිකර්ම විද්‍යාල වලට බඳවා ගනු ලබන සංඛ්‍යාව සඳහා 3.1 (අ) හි අයදුම්කරුවන් සියලුම දෙනා තෝරා ගැනීමෙන් පසුව තවදුරටත් අදාළ දිස්ත්‍රික්කයෙහි පුරප්පාඩු ඇතොත් පමණි;

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්‍ෂකයන් අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා (දෙවරකට නොවැඩි වාර ගණන තුළ) සම්මාන සාමාර්ථයක්ද ලබා තිබිය යුතුය.

3.2 2013.05.31 වැනි දිනට අපේක්‍ෂකයාගේ වයස අවුරුදු 17ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. *පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම* :

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුවේ. එහි අංක 01 සිට අංක 10 තෙක් මුල් පිටුවේ ද, 11 සිට 14 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය 3 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය මෙම ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විමසා බැලිය යුතු වේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 400කි. අපේක්ෂකයා විසින් තැපැල් කාර්යාලයකින් ලබාගත් රු. 400ක වටිනාකමින් යුත් මුදල් ඇණවුමක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් ලබාගෙන මාරු කර ගන්නා තැපැල් කාර්යාලය පේරාදෙණිය වශයෙන් සඳහන් කර අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ ඇලවීමට කටයුතු කළයුතු වේ. (ගලවා ගැනීමට හැකි වනසේ) තවද මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කරන්න. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වූ මුදල් ඇණවුම අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2013 මැයි 31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2014/2016 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කරන්න.

05. *විභාග මධ්‍යස්ථාන* :

2014/2016 කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2013 ජූලි මස 27 වැනි දින පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ :-

| *නගර අංකය* | *නගරය* | *නගර අංකය* | *නගරය* |
|---|---|---|---|
| (1) | අනුරාධපුරය | (8) | කුරුණෑගල |
| (2) | බදුල්ල | (9) | මාතර |
| (3) | මඩකලපුව | (10) | ත්‍රිකුණාමලය |
| (4) | කොළඹ | (11) | වවුනියාව |
| (5) | ගාල්ල | (12) | රත්නපුරය |
| (6) | යාපනය | (13) | හම්බන්තොට |
| (7) | මහනුවර | (14) | කිලිනොච්චිය |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය තරම් විභාග අපේක්ෂකයන් අයැදුම් කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයැදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය ද පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

06. *විභාග ක්‍රමය* :

6.1 *තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ* :

| *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|
| 01. පළමු ප්‍රශ්න පත්‍රය - කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය) | පැය 1 යි | 09 30 පැය - 10 30 පැය |

| *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|
| 02. දෙවන ප්‍රශ්න පත්‍රය - බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි) (රටා, සබඳතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක්වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ). | පැය 1 යි | 11 00 පැය - 12 00 පැය |
| 03. ඉංග්‍රීසි භාෂාව (ලකුණු 100යි) අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශ මට්ටම ආශ්‍රිතව සකස් කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන් කරුණු අවබෝධ කර ගැනීම, ඉංග්‍රීසියෙන් අදහස් සංනිවේදනය කිරීමේ හැකියාවන් හා සරල ව්‍යාකරණ හැකියාවන් පරීක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ. (මෙම ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට පමණි). | පැය 1 යි | 13 30 පැය - 14 30 පැය |

6.2 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් අනිවාර්යෙන් තමන් පාඨමාලාව හැදෑරීමට තෝරාගත් භාෂා මාධ්‍යයෙන්ම තරග විභාගයේ දී පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතුය.

6.3 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අයදුම්කරන අයදුම්කරුවන් පමණක් තම මනාපය අනුව සිංහලෙන් හෝ දෙමළෙන් පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය හැකි අතර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබීමට ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීම අනිවාර්යය වේ.

6.4 මෙහි 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් කර පහත අ, ආ, සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමඟින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳව දැන්වීම වඩා ඵලදායි වනු ඇතː-

(අ) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්
(ආ) විභාගය සඳහා මුදල් ගෙවූ මුදල් ඇණවුම්පතේ ඡායා පිටපතක්,
(ඇ) අයදුම්පත්‍ර ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.5 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් විෂයයන් දෙකේ එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.6 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමවේදය ː*

7.1 බඳවා ගන්නා වර්ෂය තුළ දී එක් එක් මාධ්‍යයෙන් සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව පදනම් කරගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්ක වලට එක් එක් මාධ්‍යයෙන් ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන්පසුව එක් එක් මාධ්‍ය සඳහා දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ පළමු හා දෙවන විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම කුසලතාව පෙන්නූ අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේ දී පහත සඳහන් කරුණු ද සැළකිල්ලට ගනු ලැබේ ː-

7.2 දිස්ත්‍රික් පදනම සළකා බැලීමේදී අ. පො. ස. (සා.පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ. අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා අයදුම්පතේ අංක 5 පිරවීම සඳහා මෙම *ගැසට් නිවේදනයේ* අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කරගත යුතුවේ.

7.3 ලිඛිත විභාගයේ කෘෂිකර්මය හා බුද්ධි පරීක්ෂණය යන විෂයයන් දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් දිස්ත්‍රික් පදනමින් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ප්‍රතිඵල ලේඛනයේ දිස්ත්‍රික් කුසලතාවය ගණනය කිරීම සඳහා අයදුම්පත්‍රයේ 5 ශීර්ෂය යටතේ වූ තොරතුරු පදනම් කරගනු ලැබේ. එහිදී අ. පො. ස. (උ.පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා විෂයයන් 03කින් එකවර සමත් වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන කුසලතාව දැක්වූ අයට ප්‍රමුඛතාවන් දෙමින් ඒ අය පළමුව තෝරා ගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් යම් මාධ්‍යයක් සඳහා එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටදී පමණක් එම දිස්ත්‍රික්කයෙන් එම මාධ්‍ය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වනසේ අ. පො. ස. (උ.පෙළ) විෂයයන් එකක් හෝ දෙකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබාගෙන කුසලතාව දැක්වූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යයෙන්ම 7.1 හා 7.2 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේදී දැක්වූ කුසලතාව අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදුකෙරේ. අදාළ වර්ෂයේදී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර හා පාඨමාලාව හදාරන එක් එක් මාධ්‍යය අනුව වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයක තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විටදී විද්‍යාලවලට එක් එක් මාධ්‍යයට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

7.4 ඉහත සඳහන් කරුණු සලකා බලමින් තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, එක් එක් දිස්ත්‍රික්කයකින් කැඳවා ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා වෙනත් සහතික හෝ පරීක්ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.5 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අවම වශයෙන් මෙම තරග විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා 40%ක් ලකුණු ලබාගත යුතු වේ. මෙම තරග විභාගයේ ඉංග්‍රීසි විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවලදී පමණක් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කුසලතාව මත හා දිස්ත්‍රික් පදනම මත තේරීම සිදුකරනු ලැබේ. එහි දී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට, අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් අතරින් පළමුවන ප්‍රශ්න පත්‍රය හා දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන ඇති 3.1 (අ) හි සඳහන් අපේක්ෂකයින් පළමුව තෝරාගනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයට නොතේරෙන අයදුම්කරුවන් ඔවුන් තරග විභාගයේදී පෙන්නුම් කළ කුසලතා මත ඔවුන් අයත් දිස්ත්‍රික්කයෙන් සිංහල හෝ දෙමළ මාධ්‍යයන්ට ඇතුළත් කිරීමට සළකා බලනු ලැබේ.

08. *"කුසුම් ලක්ෂමි කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය :*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී I කෘෂිකර්මය හා II බුද්ධි පරීක්ෂණය යන ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගත් ඕනෑම මාධ්‍යයක අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. තෝරාගත් ශිෂ්‍යත්වලාභිණියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 ක් වේ.

කේ. ජී. ශ්‍රියාපාල,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2013 මාර්තු මස 28 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**ඇමුණුම් අංක 01**

දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක

(7.2 ඡේදයට අදාළ වේ)

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 01 | අනුරාධපුරය |
| 02 | බදුල්ල |
| 03 | මඩකලපුව |
| 04 | කොළඹ |
| 05 | ගාල්ල |
| 06 | යාපනය |
| 07 | මහනුවර |
| 08 | කුරුණෑගල |
| 09 | මාතර |
| 10 | ත්‍රිකුණාමලය |
| 11 | වවුනියාව |
| 12 | රත්නපුරය |
| 13 | හම්බන්තොට |

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 14 | ගම්පහ |
| 15 | කළුතර |
| 16 | මාතලේ |
| 17 | නුවරඑළිය |
| 18 | මන්නාරම |
| 19 | මුලතිව් |
| 20 | අම්පාර |
| 21 | පුත්තලම |
| 22 | පොලොන්නරුව |
| 23 | මොණරාගල |
| 24 | කෑගල්ල |
| 25 | කිලිනොච්චිය |

***ආදර්ශ ඉල්ලුම් පත්‍රය***

*ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2013*

*(කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2014/2016)*

(COMPETITIVE EXAMINATION FOR ADMISSION TO SRI LANKA SCHOOLS OF AGRICULTURE - 2013

(DIPLOMA IN AGRICULTURE 2014-2016)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

| *විභාගයට පෙනී සිටින නගරය :* | *එහි අංකය* |
|---|---|
| 1 වැනි තේරීම ................................ | ........................ |
| 2 වැනි තේරීම ................................ | ........................ |

1. (ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2. *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*
   සිංහල මාධ්‍යය - 2
   දෙමළ මාධ්‍යය - 3
   ...............
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3. *පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍යය :*
   සිංහල මාධ්‍ය - 2
   දෙමළ මාධ්‍ය - 3
   ඉංග්‍රීසි මාධ්‍ය - 4
   .................
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :

| පුරුෂ - 0 |
|---|
| ස්ත්‍රී - 1 |

   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල අයත්වන දිස්ත්‍රික්කය :
   ..................
   දිස්ත්‍රික් අංකය :
   ...........
   (7.2 ඡේදයට අනුව/ඇමුණුම 01 බලන්න)

6. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
   විෂයයන් තුනක් එකවර - 3
   විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2
   සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය :
   .................
   (3.1 ඡේදයට අනුව)

7. (අ) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(පැහැදිලි අකුරින්)

(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
උදා. : ANANDA, K. C. B.

(ආ) (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

8. (i) සම්පූර්ණ ලිපිනය :————.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය (ඔබගේ හෝ ඔබට දුරකථන පණිවිඩයක් දිය හැකි අංකයක්) :————.

9. (අ) අ. පො.ස. (සා. පෙළ) විභාගයට පළමුවැනිවරට පෙනී සිටි පාසල හා ලිපිනය :————.

(ආ) පළමුවැනිවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :————.

(ඇ) පළමුවැනිවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.

10. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

11. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

12. උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

13. 2013.05.31 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

14. ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යෙන් කියවා මෙම කොටස පිරවිය යුතුවේ.

(අ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | සිංහල | | |
| | | ගණිතය | | |
| | | විද්‍යාව | | |
| | | කෘෂිකර්මය | | |
| | | සමාජ අධ්‍යයනය | | |
| | | ඉතිහාසය | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබාගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 1. | | 1. සිංහල | | |
| 2. | | 2. ගණිතය | | |
| 3. | | 3. විද්‍යාව | | |
| 4. | | 4. කෘෂිකර්මය | | |
| 5. | | 5. සමාජ අධ්‍යයනය | | |
| 6. | | 6. ඉතිහාසය | | |

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගය ජීව විද්‍යා විෂය ධාරාව හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)

(ඈ) අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඉ) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

15. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.

(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

16. මුදල් ඇණවුම පිළිබඳ විස්තර :

16.1 මුදල් ඇණවුමේ අංකය :————.

16.2 මුදල් ඇණවුම නිකුත් කළ තැපැල් කාර්යාලය :————.

16.3 මුදල් ඇණවුම මාරුකරන කාර්යාලය :————.
(මෙය අනිවාර්යෙන්ම පේරාදෙණිය තැපැල් කාර්යාලය විය යුතුයි.)

| |
|---|
| මුදල් ඇණවුමේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.<br>එහි ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ඔබ ළඟ තබාගන්න. |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මා අ. පො. ස. (සා. පෙළ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය යන විෂයන් තුනෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයැදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා./මිය./මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, *ගැසට් නිවේදනයේ සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් සපුරා ඇති බවට ගැසට් නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි.* තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පත්‍රයෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,<br>
අත්සන,<br>
සුදුසුකම් සහතික කරන අයගේ<br>
නිල මුද්‍රාව.

දිනය :————.<br>
නම :————.<br>
නිල නාමය :————.<br>
ලිපිනය :————.

04-654

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි**

ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවය මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය - 2012(2013)

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා වන තරග විභාගය සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2013.05.27

*සටහන* - ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :-

(අ) ජ්‍යෙෂ්ඨතාවය හා අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා ලබාගන්නා මුළු ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයට කැඳවා පත්වීම සඳහා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්වීම සඳහා තෝරාගනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

(ආ) සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද කිසියම් අපේක්ෂකයෙකු නියමිත සුදුසුකම් සපුරා නොතිබේ නම් කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊළඟ අපේක්ෂකයා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1225/32 සහ 2002.03.01 වැනි දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද හා ඉන් පසුව කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලටද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වන පන්තියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම අවුරුදු එකක (01) වැඩ බැලීමේ කාලයකට යටත්වනු ඇත.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හි විධිවිධාන හා ඊට අනුෂාංගික වන චක්‍රලේඛ අනුව අනෙක් භාෂාව පිළිබඳ

ප්‍රවීනතා මට්ටම වසර 05ක් තුලදී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර 03ක් තුලදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබාගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවය වසර හයක් (06) ඇතුලත ලබාගත යුතුය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාලවේ.

03. *වැටුප් පරිමාණය*.-මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය SL 1 -2006. රු. 22,935-10 x 645 - 8 x 790 - 17 x 1050 - 53,555 ක් වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. සුදුසුකම් - මෙම ඡේදයේ අවසානයේ දක්වා ඇති සටහන්වල විධිවිධානයන්ට යටත්ව පහත සඳහන් සුදුසුකම් තිබෙන දැනට සේවයේ නියුතු නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත පත්කරනු ලැබීම සඳහා වන (අභියෝග්‍යතා පරීක්‍ෂණයට ) විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි :-

(i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන ශ්‍රේණියේ අවුරුදු 03ක අවම සේවයක් ඇති හා එම සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු වීම ;

(ii) තුන් අවුරුදු සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනටය ;

(iii) සියලුම අයදුම්කරුවන් සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

*සටහන* - ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු පහක (05) කාලය තුළ යෙදුන සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබෙන සහ ඒ කාලය තුළ විනයානුකූල දඬුවමක් (අවවාද හැර) ලබා නැත්තාවූ නිලධාරියෙකු පමණක් සතුටුදායක සේවා කාලයක් ඇත්තකු සේ සලකනු ලැබේ. ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියෙකු මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සකු නොවේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට සිදුවනු ඇත.

05. *වයස් සීමාව* - ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වයස් සීමාව බලපානු නොලැබේ.

06. කායික යෝග්‍යතාව

(අ) සෑම අයදුම්කරුවෙකුම යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

08.

8.1 *ලිඛිත විභාගය* :

8.1.1 *අභියෝග්‍යතා පරීක්‍ෂණය*.- විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 50)

8.1.2 *විෂය නිර්දේශය*.- අධ්‍යාපන මූලධර්ම හා අධ්‍යාපනයෙන් බලාපොරොත්තුවන ඵලදායකත්වය සම්බන්ධ ක්‍රියාකාරකම් පාසල් හා අධ්‍යාපන ආයතන ඇතුළු සංවිධාන සඳහා අවශ්‍ය වන සේවක පිරිස් උපරිම ප්‍රයෝජනය ලැබෙන පරිදි ලබා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ ප්‍රශ්ණ ඇතුළත්ය. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

8.2 ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද සඳහා ලකුණු දීමේ ක්‍රමය

I *සේවා පළපුරුද්ද* - අවම සේවා කාලය වන තුන් අවුරුද්ද හැර එම ශ්‍රේණියේ ඉතිරි සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු දීමට ගණන් ගනු ලැබේ. එක් අවුරුද්දකට ලකුණු අට (08) බැගින් හිමි වන අතර අවුරුද්දකට අඩු සේවා කාලය සඳහා මාස තුනට ලකුණු දෙක (02) බැගින් ලකුණු 100ක උපරිමයකට යටත්ව ලකුණු දීම සිදු කරනු ඇත.

8.3 *සම්මුඛ පරීක්ෂණය* :-

(i) ජ්‍යෙෂ්ඨතාව හා අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා ලබාගන්නා මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලින් පිරවීමට අවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයට අදාළ සංඛ්‍යාව පමණක් සුදුසුකම් පරීක්‍ෂාකර බැලීමේ පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) සුදුසුකම් පරීක්‍ෂා කිරීම සඳහා කැඳවන ලද යම්කිසි අපේක්ෂකයෙකු හෝ අපේක්ෂකයින් සංඛ්‍යාවක් නියමිත සුදුසුකම් සපුරා නොතිබීමෙන් යම්කිසි පුරප්පාඩුවක් ඇතිවුවහොත් කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊළඟ අපේක්ෂකයින්ගෙන් ඒවා පුරවනු ලැබේ.

(iii) සමාන ලකුණු ලබා ඇති අපේක්‍ෂකයින් එක් අයෙකුට වඩා සිටී නම් ඒ ගැන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලැබේ.

(iv) මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අපේක්ෂකයින්ගේ යෝග්‍යතාව පරීක්‍ෂා කර බලන අතර ලකුණු දීමක් සිදු නොකෙරේ.

09. *විභාග කොන්දේසි* :

(i) විභාගය සිංහල දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 1,000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*— ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබෙ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ ඒ4 කඩදාසිවල සකස් කල යුතු අතර, 01 සිට 02 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද 03 සිට 09 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව සකසන්න.

(vii) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්වල නිවේදනයක් පල කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2 හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

*සැලකිය යුතුය* -(*අ*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය,

(*ආ*) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්යවේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවාද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**_ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය - 2012(2013)_**

Competitive Examination for Recruitment to Class III of the Sri Lanka Education Administrative Service on the Basis of Seniority and Merit - 2012 (2013)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

01. (i) මුලකුරු අගට යොදා මුල්'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ............................. .
*උදාහරණ* - SILVA, G.A.

(ii) මුල්'කුරු වලින් හැඳින්වෙන නම් :————.

(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. (i) වර්තමාන සේවා ස්ථානය හා කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ii) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(iii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):————.

03. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

පුරුෂ - 0

ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ii) ජන වර්ගය - (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 1

දෙමළ - 2

ඉන්දියානු දෙමළ - 3

මුස්ලිම් - 4

වෙනත් - 5

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

04. (i) උපන්දිනය :

වර්ෂය මාසය දිනය

(ii) 2013.05.27 දිනට වයස :

අවුරුදු මාස දින

(iii) විවාහක/ අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අවිවාහක - 1
විවාහක - 2

05. සේවා විස්තර -
(i) මුල් පත්වීමේ තනතුර හා පත්වීමේ දිනය :————.
(ii) දැනට ඔබ අයත්වන පළාත් අධ්‍යාපන කාර්යාලය/කලාප අධ්‍යාපන කාර්යාලය :————.
(iii) විදුහල්පති 1 ශ්‍රේණියට පත් වූ දිනය :————.

06. අධ්‍යාපන සුදුසුකම් :————.

07. වෘත්තීය සුදුසුකම් :————.

08. සහභාගි වී ඇති පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර :————.

09. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ කළ වරදකට ලැබූ කවර ආකාරයේ හෝ (අවවාද කිරීම් හැර) දඬුවම් පිළිබඳ විස්තර :————.

10. (i) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී සියලු වැටුප් වර්ධකයන් උපයාගෙන තිබේද ? :————.

(ii) උපයාගෙන නොතිබේ නම් ඊට හේතු :————.

11. ඔබට විරුද්ධව දැනට කිසියම් විනයානුකූල පරීක්ෂණයක් පවත්වමින් තිබේ නම් එහි වර්තමාන තත්වය :————.

12. පසුගිය වර්ෂ 05තුළ වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් කර ඇති විස්තර අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත උසස් කිරීම සඳහා සලකා බැලීමට මා සුදුසු බවත් මෙම ඉල්ලුම්පත්‍රයේ මා සපයා ඇත්තාවූ තොරතුරු නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉහත 05 සිට 12 දක්වා සඳහන් කර ඇති සේවා විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි. තව ද නියමිත විභාග ගාස්තුව රු. 1000 ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවද සහතික කරමි.

————,
කලාප අ.අ. /පළාත් අ.අ./පළාත් අ. ලේ.

දිනය :————.

| |
|---|
| විභාග ගාස්තු රු. 1000 ගෙවා ලබාගත් ලදුපත් මනා ලෙස මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගන්න) |

04-715/1

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012 (2013)

විවෘත තරග විභාගයක් මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

*අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය : 2013.05.27*

***සටහන*** - ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

(අ) පත්වීම සඳහා තෝරාගනු ලබන්නේ, ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ( I වන හා II වන කොටස් වලින්) ලකුණු 40%කට නොඅඩුව ලබා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයට කැඳවා පත්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

(ආ) සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද කිසියම් අපේක්ෂකයෙකු නියමිත සුදුසුකම් සපුරා නොතිබේ නම්, කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊලඟ අපේක්ෂකයා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ඇ) පත්කිරීම සඳහා තේරීම කෙරෙන්නේ විභාගයේ I වැනි හා II වැනි කොටස් වලට පෙනී සිටියා වූ ද, විභාගයේ I වැනි හා II වැනි කොටස එකට ගත්කළ ඒ සඳහා ඉහළම ලකුණු සංඛ්‍යාව ලබාගත්තා වූ ද අයගෙනි. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් එක් අයෙකුට වඩා සිටීනම් ඒ ගැන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1225/32 සහ 2002.03.01 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද හා ඉන් පසුව කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වන පන්තියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හි විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05 ක් තුළදී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර 03 ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය වසර හයක් (06) ඇතුළත ලබාගත යුතුය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

03. *වැටුප් පරිමාණය.—* මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL -1-2006 රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 -රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

04. *අධ්‍යාපන සුදුසුකම්.*—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබිය යුතු ය. නැතහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යටත් පිරිසෙයින් ඒ හා සම මට්ටමෙහිලා සලකන යම් වෘත්තිය හෝ වෙනත් විභාගයකින් සමත් වී සිටිය යුතු ය.

05. *වයස් සීමාව.*—ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

06. *කායික සුදුසුකම්* :
- (i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
- (ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

07. *වෙනත් සුදුසුකම්* :
- (i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
- (ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- (iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- (iv) තුන් වරකට වඩා මෙම විභාගයට පෙනී සිටීමට කිසිවකුට අවසර නැත.

08.

08.1 *ලිඛිත විභාගය:*

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.1.2 *විෂය නිර්දේශය* : මෙම විභාගය පවත්වනු ලබන්නේ I වැනි කොටස හා II වැනි කොටස වශයෙන් කොටස් දෙකකිනි. විභාගයේ II වැනි කොටස සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේ විභාගයේ I වන කොටසේ එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණි. I වැනි කොටසෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයින් වෙත විභාගයේ II වැනි කොටස පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙනු ලැබේ. විභාගයේ II වැනි කොටස සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතු ය.

I වැනි කොටස

පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්තය :

(i) *අවබෝධය.*— ලකුණු 100 යි - කාලය පැය 1 1/2ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 01)

විභාග අපේක්ෂකයාට කෙටි පාඨ කිහිපයක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ කිහිපයක් ඉදිරිපත් කෙරේ. ඉන් එකක් එම පාඨයේ ඇති කරුණු වලට ඉතා හොඳින් ගැලපෙනු ඇත. වඩාත් උචිත ප්‍රකාශය තෝරන ලෙස අපේක්ෂකයාට උපදෙස් දෙනු ලැබේ. අපේක්ෂකයා මෙම පාඨවල අදහස් වටහා ගන්නා අන්දම පරීක්ෂා කළ හැකිවන පරිදි ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මෙය අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය).

(ii) *බුද්ධි පරීක්ෂණය.*— ලකුණු 100 යි - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 02 )

අපේක්ෂකයාගේ තර්කන ශක්තිය පිළිබඳ සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය).

සෑම විෂයයකටම සමත් ලකුණු 40 කි.

II වැනි කොටස

පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්තය :

(i) *සාමාන්‍ය දැනීම* - ලකුණු 150 යි - කාලය පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 03)

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජීය, සංස්කෘතික, ආර්ථික පරිසරය ද ඇතුළුව අපේක්ෂකයා ජීවත්වන හා වැඩ කරන පරිසරය පිළිබඳ දැනුම මැනීමට සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික වර්ධනය පිළිබඳව ද අපේක්ෂකයින් දැන සිටිය යුතු ය. ව්‍යුහගත රචනා මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

(ii) *වාක්‍ය රචනය.*— ලකුණු 100 යි - පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 04 )

නා නා විෂයයන් අතුරෙන් තෝරා ගන්නා ලද විෂයයන් 03 ක් ගැන වාක්‍ය රචනා 03 ක් ලිවීම අපේක්ෂා කෙරේ. මෙම විෂයයන් එක් විශේෂ අධ්‍යයන ක්ෂේත්‍රයකට සම්බන්ධ නොවන අතර, අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම හා බුද්ධිය, සාමාන්‍ය කල්පනා කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ඇත. වාක්‍ය රචනාවල තත්ත්වය නිශ්චය කරනුයේ විෂය පිළිබඳව ඇති නිර්මාණ ශක්තිය හා කල්පනා ශක්ති ප්‍රමාණය මෙන්ම ඒවා ඉදිරිපත් කරන ආකාරය ද අනුවය.

II කොටසේ සෑම විෂයයකටම සමත් ලකුණු 40 කි.

08.2 *සම්මුඛ පරීක්ෂණය* :

- (i) ලිඛිත විභාගවල දී වැඩිම ලකුණු ලබාගත් කුසලතා අනුපිළිවෙලින් පිරවීමට අවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයට අදාළ සංඛ්‍යාව පමණක් සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- (ii) සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ බඳවා ගැනීමේ පටිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමටයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කරනු ඇත.

09. *විභාග කොන්දේසි* :

- (i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය

යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) I වැනි කොටස සඳහා විභාග ගාස්තුව රු.600 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ' තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. II වැනි කොටස සඳහා විභාග ගාස්තුව රු.400 කි. විභාගයේ දෙවැනි කොටස සඳහා ගාස්තු ගෙවිය යුතු ආකාරය එම කොටසට පෙනී සිටීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් පසුව දැනුම් දෙනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත් වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*— ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 01 සිට 02 තෙක් ශීර්ෂ පළමුවැනි පිටුවට ද, 03 සිට 05 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවට ද, ඉතිරිය තුන්වැනි හා හතරවැනි පිටුවට ද වන ලෙස සකස් කළයුතු බවත් ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

(vii) ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම පුවත්පත් වල නිවේදනයක් පළකරනු ලැබේ. නිවේදනය පළ වී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

*සැලකිය යුතු ය* - (*අ*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(*ආ*) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතු ය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතිකකරවා ගත යුතු ය.

10. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

එස්.එම්.ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ආදර්ශ අයැදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට)
බඳවා ගැනීමේ විවෘත තරග විභාගය-2012(2013)

Open Competitive Examination for Recruitment to Class III (General) of the
Sri Lanka Education Administrative Service– 2012 (2013)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

1.0 නම :

1.1 මුල් අකුරු අගට යොදා මුල් අකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදාහරණ - SILVA , G.A.) :—————.

1.2 ස්ත්‍රී පුරුෂ භාවය -

පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

1.3 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

1.4 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

1.5 ජාතික හැඳුනුම්පත් අංකය

2.0 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—.

3.0

3.1 ජනවර්ගය :

සිංහල - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

3.2 විවාහක /අවිවාහක බව :

අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

3.3 උපන්දිනය

වර්ෂය මාසය දිනය

3.4 2013.05.27 දිනට වයස :

අවුරුදු මාස දින

4.0 මෙම තනතුර සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය සමත් වූ භාෂා මාධ්‍යය :—————.

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 උපාධිය හෝ වෙනත් සුදුසුකම් ලද දිනය :—————.

5.2 විශ්වවිද්‍යාලය/ආයතනය :—————.

5.3 විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි අංකය :—————.

5.4 බාහිර /අභ්‍යන්තර :—————.

5.5 උපාධිය :—————.

5.6 විෂයයන් :—————.

5.7 පන්තිය :—————.

5.8 ඉහළ/පහළ :—————.

5.9 විභාග අංකය :—————.

5.10 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

6.0 2002, 2005, 2010 වර්ෂවල දී පවත්වන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගවලට පෙනී සිටියේ ද යන්න සඳහන් කරන්න :—————.

7.0 විභාග ගාස්තු :

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මනා ලෙස මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

8.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් විභාග ගාස්තු ගෙවන ලද අංක ................. හා ................. වැනි දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු

කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකග වෙමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුව ද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත්වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කිරීම

මෙහි අත්සන් කරන ලද ................................... හි පදිංචි .......................... මයා/මිය/මෙනවිය මම පුද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් ඔහු/ඇය ගේ අත්සන මා ඉදිරිපිට දී තැබූ බවත්, සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය:————.

නම :————.

තනතුර :————.

ලිපිනය :————.

04-715/2

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2012(2013)

සීමිත තරග විභාගයක් මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය : 2013.05.27.

සටහන - ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :-

(අ) පත්වීම් දීම සඳහා තෝරාගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ලකුණු 40%කට නොඅඩුව ලබා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයට කැඳවා තනතුර සඳහා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ය. පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

(ආ) සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද කිසියම් අපේක්ෂකයෙකු නියමිත සුදුසුකම් සපුරා නොතිබේ නම් කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊළඟ අපේක්ෂකයා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

02. *වැටුප් පරිමාණය* :- මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 රු. 22,935-10x 645-8x790-17x1,050-53,555 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1225/32 සහ 2002.03.01 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද හා ඉන් පසුව කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වැනි පන්තියට පත් කරනු ලැබේ.

(ii) තනතුරට පත්කරනු ලබන නිලධාරින් සේවයේ අවශ්‍යතාව මත මධ්‍යම රජයේ තනතුරුවල හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල සේවය කළ යුතු ය.

(iii) සාමාන්‍ය සේවක සංඛ්‍යාවට පත්කරනු ලබන තැනැත්තෙකු එසේ පත්කරනු ලැබීමට පෙරාතුව කිසියම් අවස්ථාවක අවම වශයෙන් අවුරුදු 03ක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් සේවය කර නොමැත්තේ නම් එසේ පත්කරනු ලැබූ විට වසර 03ක කාලයක් රජයේ පාසැලක විදුහල්පතිවරයෙකු වශයෙන් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කිසියම් තැනැත්තෙකු එසේ කර තිබූ කාල සීමාව වසර 03ක ට වඩා අඩුවන අවස්ථාවක දී එසේ පත්කරනු ලැබීමෙන් පසු සම්පූර්ණ කළ යුතු සේවා කාලය කලින් ඔහු විසින් සේවය කළ කාලය හා වසර 03ක කාලසීමාව අතර වෙනසට සමාන විය යුතු ය.

(iv) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

( v) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

(vi) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හි විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතු ය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය

ලබාගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවය වසර හයක් (06) ඇතුළත ලබාගත යුතු ය.

(vii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

04. *වෘත්තීය සුදුසුකම්.* - (අ) මෙම ඡේදයේ අවසානයේ දක්වා ඇති සටහන්වල විධිවිධානයන්ට යටත්ව පහත සඳහන් සුදුසුකම් තිබෙන රජයේ පාසලක හෝ ආධාර ලබන පාසලක හෝ පිරිවෙන් ගුරුවරයෙකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි.

*(ආ) (i) සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරු සඳහා.—*

උපාධියෙන් පසු යටත් පිරිසෙයින් වර්ෂ 05ක් ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධාරී ගුරුවරයකු (හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උපාධියක සම තත්ත්වයේ ලා සලකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් අයකු) වීම හෝ පුහුණු ගුරු සහතිකය සහිත උපාධිධාරියකු (හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උපාධියක සම තත්ත්වයේ ලා සලකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් අයකු) වීම හෝ පුහුණුවෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 05ක ඉගැන්වීමේ පළපුරුද්ද ලබා ඇති පුහුණු ගුරුවරයෙක් වීම හෝ ගුරුවරයකු වශයෙන් පූර්ණ අවුරුදු 10ක සේවයක් ඇති පුහුණු ගුරුවරයකු වීම.

*සටහන* - (අභ්‍යාසලාභී පදනම මත ගුරු සේවයට පත් කරන ලද උපාධිධාරී ගුරුවරුන්ගේ පත්වීම් දින සිට සේවා කාලය ද සේවයේ යෙදී සිටිය දී උපාධිය සමත් වූ ගුරුවරුන්ගේ එම උපාධිය සමත් වූ දින සිට සේවා කාලය ද මෙම පස් අවුරුදු සේවා කාලයට ගණන් ගනු ලැබේ.).

(ii) *විශේෂ සේවක සංඛ්‍යාවේ තනතුරු සඳහා—*

යටත් පිරිසෙයින් අවුරුදු 3ක් අයැදුම් කරනු ලබන විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද සහිත අයදුම් කරන විෂය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ අයදුම් කරන විෂය පිළිබඳව පුහුණු ගුරු සහතිකයක් සහිත ගුරුවරයෙකු (හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සම තත්ත්වයෙහි ලා සලකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් හෝ සමත් අයකු) වීම.

*සටහන* - නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය, හස්ත කර්මාන්තය, ශාරීරික අධ්‍යාපනය, චිත්‍ර කර්මය, ගෘහ විද්‍යාව, විශේෂ අධ්‍යාපනය හා පිරිවෙන් යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ගුරුපත්වීමක් සහිත ගුරුවරයෙක් වශයෙන් අදාළ විෂයයේ හෝ අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු 05කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හෝ අංක ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වූ අපේක්ෂකයකු ද මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබූවකු සේ සලකනු ලැබේ.

05. *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

6. *වයස් සීමාව.*—ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 25ට නොඅඩු සහ අවුරුදු 50ට නොවැඩි විය යුතු ය.

07. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iv) හත් (07) වරකට වඩා සීමිත තරග විභාගයට පෙනී සිටීමට කිසිවකුට අවසර නැත. තවද සීමිත තරග විභාගය සහ විවෘත තරග විභාගය යන විභාග දෙකටම හත් (07) වරකට වඩා පෙනී සිටීමට අවසර නැත.

(v) අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් නොමැති නම් මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරියෙකුට කිසිම සුදුසුකමක් නැත.

(vi) මෙම කාලය තුළ කරන ලද වරදකට "අවවාද කිරීම් හැර" කිසියම් දඬුවමක් ලබා නැත්නම් ද (සේවයේ හෝ දෙපාර්තමේන්තුමය හෝ විභාගයකින් සාමාර්ථය ලබා ගැනීමට නොහැකි වීම පමණක් නිසා වැටුප් වර්ධක ලබාගැනීමට නොහැකි වීම හේතු කොට ගෙන නිලධාරියෙකු නුසුදුස්සෙකු වන්නේ නැත) ඔහුට/ඇයට සතුටුදායක සේවා කාලයක් තිබුණේ යැයි සලකනු ලැබේ.

(vii) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියෙකු මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෙකු නොවේ.

08. *අයදුම්කිරීමේ ක්‍රමය :*

(i) සේවයේ III පන්තියේ සේවක සංඛ්‍යාව "සාමාන්‍ය" සේවක සංඛ්‍යාවකින් සහ "විශේෂ" සේවක සංඛ්‍යාවකින් සමන්විත වේ. එක් අයදුම්කරුවෙකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අමතරව විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ පහත III (ආ) වැනි ඡේදයේ සඳහන් ක්ෂේත්‍රයන්හි පුරප්පාඩු සඳහා ද අයැදුම් කළ හැකිය. එක් අයදුම්කරුවෙකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට සහ විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ ක්ෂේත්‍ර දෙකකට අයදුම් කළ හැකිය. විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයැදුම් කරනු ලබන්නේ නම් එහිදී ඉල්ලුම් කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යාවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් 1/3 ක් වත් අයදුම් කරන විෂයට අදාළ වන විෂයයන් විය යුතු ය. සැලසුම් හා විශේෂ අධ්‍යාපන විෂයයන් සඳහා අවශ්‍ය සුදුසුකම් වෙනමම දක්වා ඇත.

(ii) එක් අපේක්ෂකයෙකු සාමාන්‍ය සේවක සංඛ්‍යාවට හා විශේෂ සේවක සංඛ්‍යාවේ විෂයයන් කිහිපයකට තේරී පත්වුවහොත් බඳවා ගනු ලබන විෂය තීරණය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(iii) විශේෂ සේවක සංඛ්‍යාවේ විෂය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක පහත දක්වනු ලැබේ. තමා අයදුම්කරන විෂය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක අයැදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය.

සංකේත අංකය

| | | |
|---|---|---|
| (අ) | සාමාන්‍ය සේවක සංඛ්‍යාව | 11 |
| (ආ) | විශේෂ සේවක සංඛ්‍යාව | |
| | විෂය ක්ෂේත්‍රය | |
| | ඉංග්‍රීසි | 21 |
| | ගණිතය | 22 |
| | විද්‍යාව | 23 |
| | චිත්‍රකලාව | 24 |
| | සංගීතය (පෙරදිග) | 25 |
| | සංගීතය (අපරදිග) | 26 |
| | නැටුම් | 27 |
| | ශාරීරික අධ්‍යාපනය | 28 |
| | කෘෂි විද්‍යාව | 29 |
| | වාණිජ්‍ය විද්‍යාව | 30 |
| | හස්ත කර්මාන්තය | 31 |
| | ගෘහ විද්‍යාව | 32 |
| | විශේෂ අධ්‍යාපන | 33 |
| | සැලසුම් | 34 |
| | අරාබි | 35 |
| | තොරතුරු තාක්ෂණය | 36 |
| | පිරිවෙන් | 37 |

*සැ. යු.* : සීමිත තරග විභාග යටතේ විශේෂ සේවක සංඛ්‍යාවේ ***විශේෂ අධ්‍යාපනය*** යන විෂයය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත දැක්වෙන උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඉන් සමත්ව තිබිය යුතු ය :

ඌනතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය (විශේෂ අධ්‍යාපනය) සම්බන්ධයෙන් පිරිනැමෙන අධ්‍යාපනවේදී උපාධි සහතිකය ;

විශේෂ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය ;

විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධි සහතිකය;

විශේෂ සේවක සංඛ්‍යාවේ සැලසුම් විෂයය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත දැක්වෙන උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඉන් සමත් ව තිබිය යුතු ය;

සංඛ්‍යාත විද්‍යාව උපාධියට විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් වෙනත් විෂයයක අනු විෂය ක්ෂේත්‍රයක් වශයෙන් හදාරා තිබීම;

ගණිතය උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂය ක්ෂේත්‍රයට අනු විෂයයක් වශයෙන් හදාරා තිබීම;

කළමනාකරණ හා සැලසුම් ශිල්ප ක්‍රම උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධි විෂයන්ට අයත් අනු විෂයයක් ලෙසට හදාරා තිබීම.

අධ්‍යාපන විද්‍යාව, මූලධර්ම හා තුලනාත්මක අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍ර උපාධි විෂයයක් ලෙසට හෝ උපාධියට අයත් විෂයන්ගේ අනුවිෂයයක් ලෙසට හදාරා තිබීම;

සමාජවිද්‍යාව උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂයයක අනු විෂයයක් ලෙසට හදාරා තිබීම;

ජෛවීය විද්‍යා හෝ භෞතීය විද්‍යා උපාධි විෂයයන් සමග සංඛ්‍යානය හෝ පර්යේෂණ කටයුතු උපාධි අනුවිෂයකට අයත් විෂය කොටස් ලෙසට හදාරා තිබීම.

09.

09.1 *ලිඛිත විභාගය* :

9.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

9.1.2 *විෂය නිර්දේශය* :

(i) *අවබෝධය* - කාලය පැය 1 1/2 (ලකුණු 100)
විභාග අපේක්ෂකයාට කෙටි පාඨ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට ඉතා හොඳින් ගැලපෙනු ඇත. වඩාත්ම උචිත ප්‍රකාශය තෝරන ලෙස විභාග අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ. විභාග අපේක්ෂකයා අනෙක් පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්‍ෂා කිරීමට හැකිවන පරිදි එම පාඨ සම්බන්ධයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මෙය අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(ii) *බුද්ධි පරීක්ෂණය* - කාලය පැය 1 (ලකුණු 100)
අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය මැනීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.).

(iii) *අධ්‍යාපන පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය* - කාලය පැය 2 (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) (ලකුණු 100).

සෑම විෂයයකටම සමත් ලකුණු 40කි.

10. *සම්මුඛ පරීක්ෂණය.*—සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ බඳවා ගැනීමේ පටිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමටයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කරනු ඇත.

11. *විභාග කොන්දේසි* :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 1,000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත් වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ ඒ4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 01 සිට 02 තෙක් ශීර්ෂ පළමු වැනි පිටුවටද 03 සිට 04 තෙක් ශීර්ෂ දෙ වැනි පිටුවටද, ඉතිරිය තුන් වැනි හා හතර වැනි පිටුවලට ද වන ලෙස සකස් කළ යුතු බවත්, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

(vii) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2 හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*— විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ :

(i) පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

*සැලකිය යුතුය* - (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතු ය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

12. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

***ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට/විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2012 (2013)***

LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO CLASS III (GENERAL/SPECIAL) OF THE SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE - 2012 (2013)

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට පිටපත් දෙකකින් ඉදිරිපත් කරන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

විභාගයට පෙනී සිටින සේවක සංඛ්‍යාව:

සාමාන්‍ය සේවක සංඛ්‍යාව - 1

විශේෂ සේවක සංඛ්‍යාව - 2

දෙකටම - 3

(අදාළ කොටුව තුළ ලියන්න.)

ඉල්ලුම් කරන සේවක සංඛ්‍යාව/විශේෂ සේවක සංඛ්‍යාවේ නම් විෂය ක්ෂේත්‍රයේ සංකේත අංකය පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න. (ගැසට් නිවේදනයට අදාළව).

| සේවක සංඛ්‍යාවේ නම | විෂය ක්ෂේත්‍රයේ නම | සංකේත අංකය |
|---|---|---|
| සාමාන්‍ය | | |
| විශේෂ | | |
| විශේෂ | | |

1.0 නම :

1.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදාහරණ - SILVA , G.A.) :—————.

1.2 ස්ත්‍රී පුරුෂ භාවය :

පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී - 1

1.3 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

1.4 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

1.5 ජාතික හැඳුනුම්පත් අංකය:

2.0 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

2.1 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

3.0

3.1 ජනවර්ගය :

සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 විවාහක /අවිවාහක බව :

අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
විවාහක - 2

3.3 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

3.4 2013.05.27 දිනට වයස :

අවුරුදු මාස දින

4.0 අධ්‍යාපන සුදුසුකම් :

(අ) (i) උපාධිය සමත් වර්ෂය :—————.
(ii) හදාරන ලද විෂයයන් :—————.
(iii) විශ්ව විද්‍යාලය/ආයතනය :—————.
(iv) බාහිර/අභ්‍යන්තර :—————.

(ආ) (i) පශ්චාත් උපාධිය සමත් වර්ෂය :—————.
(ii) හදාරන ලද විෂයයන් :—————.
(iii) විශ්ව විද්‍යාලය/ආයතනය :—————.

5.0 (i) ගුරුවරයකු වශයෙන් මුලින්ම රජයේ සේවයට පත් වූ දිනය :—————.
(ii) දැනට සේවය කරන අධ්‍යාපන කලාපය :—————.
(iii) 2013.05.27 දිනට සේවා කාලය :
අවුරුදු :—————. මාස :—————. දින :—————.

6.0 (i) ගුරු පුහුණුව ලත් වර්ෂය :—————.
(ii) ගුරු විදුහලේ නම :—————.
(iii) පුහුණු සහතිකය වලංගු වන දිනය :—————.
(iv) පුහුණුව ලත් විෂයය ක්ෂේත්‍රය :—————.
(v) පුහුණුවෙන් පසු ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට ඉගැන්වීමේ පළපුරුද්ද :
අවුරුදු :—————. මාස :—————. දින :—————.

7.0 ඔබ දැනට දරන තනතුරේ ස්ථිර කරනු ලැබ ඇත්තේ ද? :—————.

8.0 ඔබ රජයේ සේවයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂාව සඳහන් කරන්න :—————.

9.0 විභාග ගාස්තු :

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මනා ලෙස මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

10.0 මීට ප්‍රථම මෙම විභාගයට හා විවෘත තරග විභාගයට පෙනී සිටි වාර ගණන :—————.

11.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................. හා

................. වැනි දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීති වලට අනුව ක්‍රියාකිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුවද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත්වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ................................... පූජ්‍ය/මහතා/මහත්මිය/මෙනවිය මගේ විද්‍යාලයේ සේවය කරන ගුරුවරයෙක් බව මෙයින් සහතික කරමි.

————,
විදුහල්පතිගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය:————.

*විභාග කොමසාරිස් ජනරාල්,*

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ................................... පූජ්‍ය/මහතා/මහත්මිය/මෙනවිය මගේ කලාපයේ ................. විදුහලේ සේවය කරන ගුරුවරයෙකු බවත් 03, 04, 05, 06, 07, 08, 09, සහ 11 ඡේදවල සඳහන් කරන විස්තර කාර්යාලයේ ඇති ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.

දිනය:————.

04-715/3

---

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2013 ජූලි මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2013.05.31 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලබන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අංක 01 සිට 04 (ii) තෙක් විස්තර මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ ද ඇතුළත් කර තම අයදුම්පත සකස් කරගත යුතුය. අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. තව ද, අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂා ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයේ ඉහළින් ඇති සියලු තොරතුරු නිවැරදිව සඳහන් කළ යුතු ය.

03. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් (*උදා.* : ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මඟින්) 2013.05.31 වැනි දින හෝ ඊට පෙර, බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත්‍රය විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා වන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා නව ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

04. අයදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපත සමග ප්‍රවේශ පත්‍රය නිකුත් කරනු ඇත. අපේක්ෂකයන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ඔබ භාරයේ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(i) විභාගයේ නම :————.
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(iii) සම්පූර්ණ ලිපිනය :————.
(iv) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————.
ලියාපදිංචි අංකය සහ දිනය :————.

05. *අනන්‍යතාව* :

අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් එකක් පමණක් භාර ගැනේ :-

(i) පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

06. *විභාග ගාස්තු* :

මෙම විභාගයට පෙනී සිටින විභාග අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ.

විභාග ගාස්තු :

(*අ*) පළමුවන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.
(*ආ*) පළමුවන වතාවෙන් පසු එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා රු. 1000.00 ක් බැගින් අය කෙරේ.
(*ඇ*) එක් විෂයයක් සඳහා රු. 500 ක් අය කෙරේ.

අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003 -02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ, එහි දාරයක් නොගැලවෙන සේ අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) ඡේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්ෂකයන් සඳහා නීතිරීති මේ විභාගය සඳහාද බල පැවැත්වේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

08. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ඉල්ලුම්පත්‍රය යොමුකළ සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

10. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැළපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළකරන ලද දැන්වීම බලාත්මක වේ.

11. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අදාළ වන විෂය නිර්දේශයන් පහත දක්වා ඇත.

***ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයය නිර්දේශය***

01. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත :-

| | | |
|---|---|---|
| (i) | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | - ලකුණු 100 යි (විෂය අංක - 01) |
| (ii) | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | - ලකුණු 100 යි (විෂය අංක - 02) |
| (iii) | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | - ලකුණු 100 යි (විෂය අංක - 03) |
| (iv) | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍යක්‍රම | - ලකුණු 100 යි (විෂය අංක - 04) |
| (v) | ඉංග්‍රීසි භාෂාව | - ලකුණු 100 යි. (විෂය අංක - 05) |

02. සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.

03. සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම කාලය පැය 03කි.

04. ප්‍රශ්න පත්‍රයක ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

05. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතු වේ.

**විභාග පරිපාටිය**

පළමුවැනි ප්‍රශ්න පත්‍රය - ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන :

(i) ජාතික පරමාර්ථයන් හා ප්‍රමුඛතාවන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමසම්පාදන ප්‍රතිපත්ති රාමුව සහ වැඩසටහන්;

(ii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහිලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම ආදිය;
(iii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපනය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණ හා විමර්ශන ජනවිකාශ සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ.

*දෙවැනි ප්‍රශ්න පත්‍රය* . - ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය :

(i) නිපැයුම හා බෙදා හැරීම පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූල ධර්ම;
(ii) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළඳාම;
(iii) මූල්‍ය, මුදල්, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය;
(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය;
(v) ආර්ථිකය සමාලෝචනය කිරීම;
(vi) ශිල්පීය පුහුණු සහ නුපුහුණු මිනිස් බලය සහ විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම සහ ඒවා උපයෝගීකරණය;
(vii) ආර්ථික, විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි;
(viii) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහිලා උපයෝගී කර ගන්නා මූලික සංඛ්‍යාන සංකල්ප හා ක්‍රම;
(ix) ප්‍රතිලාභ/පිරිවැය විශ්ලේෂණ මූලධර්ම.

*තුන්වැනි ප්‍රශ්න පත්‍රය*.—ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ සහ පසුවිපරම් කටයුතු :

(i) ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂණය ;

(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම/අධීක්ෂණය, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, පසුවිපරම් සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු;

(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල සාකල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය.

*හතරවැනි ප්‍රශ්න පත්‍රය.*—ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම :

(i) ආණ්ඩුවේ මුදල් රෙගුලසි I වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)

(ii) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවැනි කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද :

(iii) *ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය.*—රාජ්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය, විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම, රාජ්‍ය ආදායම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය, වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්යභාරය, රාජ්‍ය ව්‍යාපාර කමිටුව;

(iv) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත්කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්ය භාරය;

(v) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, වාර්ෂික ආදායම් හා ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම, අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පරිපූරක ඇස්තමේන්තු;

(vi) *රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය*—භාණ්ඩ, සේවා හා වැඩ ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටුවල සංයුතිය, පත්කිරීම්, බලතල හා කාර්යභාරය, ලංසු ඇගයීමේ ක්‍රියා පටිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය.

*පස්වැනි ප්‍රශ්න පත්‍රය.*—ඉංග්‍රීසි භාෂාව

ක්‍රමසම්පාදනය, සංවර්ධනය, සැලසුම්කරණය සහ කළමනාකරණය යන විෂයයන්ට අදාළව අපේක්ෂකයින්ගේ අධ්‍යාපනික හා වෘත්තීය ඉංග්‍රීසි භාෂා කුසලතාවය මැනීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 අප්‍රේල් මස 26 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

*අයදුම්පත්‍රය*

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

FIRST EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE III OF THE SRI LANKA PLANNING SERVICE - 2013

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) : [ ]

සිංහල - 2
දෙමළ - 3 (ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට
ඉංග්‍රීසි - 4 ඉඩ දෙනු නොලැබේ.)

01. නම :

1.1 මුල'කුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් - *උදා* : SILVA, B. A.)
1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. කාර්යාලීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.1 කාර්යාලීය ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය පුරුෂ - 0 [ ]
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය: [ | ]

3.3 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

04. *ගැසට් නිවේදනයේ 11 වැනි ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් :*

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ........................ | [ ] |
| ........................ | [ ] |
| ........................ | [ ] |
| ........................ | [ ] |
| ........................ | [ ] |

05. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.
*(නිත්‍ය වශයෙන් රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතු ය.)*

06. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක් ද? :————.

07. දෙපාර්තමේන්තුවේ නම : (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————.

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :

*ලදුපත නොගැළවෙන සේ හොඳින් අලවන්න.*
*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතු ය.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිණියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන .......................... මහතා/මහත්මිය/මෙනෙවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,
(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
*(නිල මුද්‍රාව තැබිය යුතුය)*

තනතුර :————.

දිනය :————.

04-838/1

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2013 ජූලි මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2013.05.31 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලබන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක අංක 01 සිට 04 තෙක් විස්තර මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ ද ඇතුළත් කර තම අයදුම්පත සකස් කරගත යුතුය. අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. තව ද, අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂා ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයේ ඉහළින් ඇති සියලුම තොරතුරු නිවැරදිව සඳහන් කළ යුතුය.

03. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් (*උදා.* : ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මඟින්) 2013.05.31 දින හෝ ඊට පෙර, බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත්‍රය විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා වන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා නව ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

04. අයදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපත සමග ප්‍රවේශ පත්‍රය නිකුත් කරනු ඇත. අපේක්ෂකයන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ඔබ භාරයේ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(i) විභාගයේ නම :————.
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(iii) සම්පූර්ණ ලිපිනය :————.
(iv) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————.
ලියාපදිංචි අංකය සහ දිනය :————.

05. *අනන්‍යතාව :*

අපේක්‍ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාගශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් එකක් පමණක් භාර ගැනේ :-

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවෙකුගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

06. *විභාග ගාස්තු :*

මෙම විභාගයට පෙනී සිටින විභාග අපේක්‍ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ :-

*විභාග ගාස්තු :*

(අ) පළමුවැනි වතාව සඳහා කාර්යක්‍ෂමතා කඩඉම විභාග දෙක වෙනුවෙන් ගාස්තු අය නොකෙරේ.
(ආ) පළමුවැනි වතාවෙන් පසු එක් එක් කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සඳහා රු. 1000.00 ක් බැගින් අය කෙරේ.
(ඇ) එක් විෂයයක් සඳහා රු. 500 ක් අය කෙරේ.

අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ, එහි දාරයන් නොගැලවෙනසේ අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයන් යටත් කෙරේ. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) ඡේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්‍ෂකයන් සඳහා නීතිරීති මේ විභාගය සඳහා බල පැවැත්වේ. විභාගය ආරම්භ වන දිනයේ විභාගශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

08. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ඉල්ලුම්පත්‍රය යොමුකළ සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, අපේක්‍ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

10. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂා වලින් පළකිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළකරන ලද දැන්වීම බලාත්මක වේ.

11. දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සඳහා අදාළ වන විෂය නිර්දේශයන් පහත දක්වා ඇත :-

***ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය***

01. දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත :-

(i) සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම - ලකුණු 100 යි (විෂය අංක - 06)
(ii) මූලික සාර්ව ආර්ථික විද්‍යාව - ලකුණු 100 යි (විෂය අංක - 07)
(iii) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම - ලකුණු 100 යි (විෂය අංක - 08)

02. සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

03. සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම කාලය පැය 03 කි.

04. ප්‍රශ්න පත්‍රයක ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

05. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්‍ෂකයෙකු විසින් ලබාගත යුතුවේ.

විභාග පරිපාටිය

(i) සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම :
(අ) ස්වොට් විශ්ලේෂණය (SWOT)
(ආ) ගැටලු වෘක්ෂය
(ඇ) තර්ක රාමු විශ්ලේෂණය
(ඈ) පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණය
(ඉ) පිලි ලදුව ක්‍රමවේදය
(ඊ) ශුද්ධ වර්තමාන අගය
(උ) අභ්‍යන්තර ඵලදා අනුපාතය
(ඌ) ඡායා මිල යොදා ගැනීම

(ii) මූලික සාර්ව ආර්ථික විද්‍යාව :
(අ) ජාතික ගිණුම්
(ආ) ආර්ථික වර්ධන වේගය
(ඇ) සමතුලිත ජාතික ආදායම
(ඈ) ගණිත ප්‍රතිවිපාකය
(ඉ) උද්ධමනය
(ඊ) පොළී අනුපාතය
(උ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(ඌ) මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(එ) වෙළඳ චක්‍ර

(iii) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම :

(අ) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇතිවන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකා ඔස්සේ පිළිතුරු සැපයීමට සිදුවේ.)

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ 01, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*අයදුම්පත්‍රය*

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

SECOND EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE III OF THE SRI LANKA PLANNING SERVICE - 2013

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) ☐ ☐ (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

සිංහල - 2
දෙමළ - 3 (ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට
ඉංග්‍රීසි - 4 ඉඩ දෙනු නොලැබේ.)

01. නම :

1.1 මුල්'කුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - *උදා* : SILVA, B. A.
1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

02. කාර්යාලීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.1 කාර්යාලීය ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂභාවය පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය: ☐☐

3.3 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. *ගැසට් නිවේදනයේ 11 වැනි ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයන් :*

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ........................ | ☐ |
| ........................ | ☐ |
| ........................ | ☐ |

05. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.

*(නිත්‍ය වශයෙන් රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතු ය.)*

06. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක් ද? :————.

07. දෙපාර්තමේන්තුවේ නම : (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————.

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :

*ලදුපත නොගැළවෙන සේ හොඳින් අලවන්න.*
*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතු ය.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිණියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන .......................... මහතා/මහත්මිය/මෙනෙවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,
(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
*(නිල මුද්‍රාව තැබිය යුතුය)*

තනතුර :————.

දිනය :————.

04-838/2

## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය

### ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම - 2013/2014

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්‍ෂණික ආයතනය මඟින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්‍ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය නව පරිශ්‍රය දියගම, හෝමාගම ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්ව විද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය* :

ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්‍ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

(අ) *නාවුක අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (Set 1)*

(i) නාවුක ඉංජිනේරු තාක්‍ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්‍ෂණය

(ආ) *අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍රයන් (Set 2)*

(i) රසායන ඉංජිනේරු තාක්‍ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්‍ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්‍ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්‍ෂණය
(v) යාන්ත්‍රික ඉංජිනේරු තාක්‍ෂණය
(vi) පොලිමර් තාක්‍ෂණය
(vii) ජේෂකර්ම හා ඇඟලුම් තාක්‍ෂණය

2. *යෝග්‍යතාවය* :

2.1 *වයස* :

(අ) 2012.12.31 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 ට වැඩි නොවිය යුතු ය.

(ආ) නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය හා නාවුක ඉංජිනේරු තාක්‍ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්‍ෂකයන් තෝරා ගැනීමේ දී 2012.12.31 වැනි දිනට වයස අවුරුදු 20 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්‍ෂණයකට හා සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින්, 2010, 2011 හෝ 2012 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතු ය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම/ක්‍රියාපටිපාටිය* :

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම* :

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මඟින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්‍ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරාගනු ලැබේ. (Z ලකුණු මත). 40% ක් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රය* :

යෝග්‍යතා පරීක්‍ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්‍ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්‍ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල* :

4.1 *අයදුම්පත් පෝරම* :

(i) *ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.*

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක :
http ://www.mrt.ac.lk/itum

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළත් වීම - 2013/2014 " යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

"නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්‍ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව".

(iii) තම ලිපිනය ලියන ලද රු. 40 ක් වටිනා මුද්දර අලවන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමඟ එවිය යුතු ය.

(iv) අයදුම්පත සමඟ සහතිකවල මුල්පිටපත් හෝ පිටපත් එවීම අවශ්‍ය නොවේ. එහෙත් අයදුම්පතේ සඳහන් තොරතුරු අදාළ පරිදි සහතික කර තිබිය යුතු ය. (අයදුම්පතේ 03, 04 සහ 05 යන ඡේද බලන්න).

4.2 *අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරා ගැනීම :*

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(ii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම් කරන්නේනම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතු ය.

(iii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේ දී, එනම් නාවුක ඉංජිනේරු තාක්ෂණය සහ නෞකා චලන අධ්‍යයන තාක්ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතු ය.

(iv) අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 07 ලෙස ද සඳහන් කළ යුතු ය.

5. (i) *ඉල්ලුම් පත්‍ර ගාස්තු :*

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා රු. 300 (තුන්සීයක්) හෝ ක්ෂේත්‍රයන් දෙකටම රු. 500 (පන්සීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 0000308280" දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතු ය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.05.31 වැනි දින වේ.

6. *යෝග්‍යතා පරීක්ෂණය :*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලඝු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :*

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය :

* අ. පො. ස. (උ. පෙළ) සහතිකය ;
* අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සඳහන් සහතිකය ;
* පාසැල් හැරයාමේ සහතිකය ;
* උප්පැන්න සහතිකය ;
* නමේ වෙනසක් ලියකියවිලිවල හා සහතිකපත්වල ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්.

8. *ඉතා වැදගත් :-*

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්වවිද්‍යාලය හැර).

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්ෂ,
තාක්ෂණික ආයතනය.

2013 අප්‍රේල් මස 26 වැනි දින,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

| | |
|---|---|
| APPLICATION FOR ADMISSION TO THE NATIONAL DIPLOMA IN TECHNOLOGY COURSE | *For office use only* |
| INSTITUTE OF TECHNOLOGY<br>UNIVERSITY OF MORATUWA | Application No. |
| ACADEMIC YEAR 2013/2014 | District |

Application for (Please ✓ )

1. Maritime Fields - SET 1 [ ]
2. Other Fields - SET 2 [ ]

[Applicants may apply for single set (Set 1 or Set 2)
or both sets (Set 01 and Set 02)]

01. Personal Details : (Please use **BLOCK CAPITALS**)

Name in Full :

(Leave one blank cage between names)

Name with Initials :

(Leave one blank cage between names)

| *Title* | Mr./Ms. | Sex | Male/Female | | |
|---|---|---|---|---|---|
| Age As at 31st Dec. 2012 | (Years) | (Months) | Date of Birth | | |
| | | | Date | Month | Year |
| National ID Number | | | | | |

02. Contact Details :

Address (Residence):

(Leave one blank cage between different segments of the address)

| | |
|---|---|
| Telephone | |
| Mobile | |
| E-mail (if available) | |

03. Results of G. C. E. (Advanced Level) Examination :

| *Subjects & Details of Examination* | *Grades & Details obtained at the* | | |
|---|---|---|---|
| | *1st Attempt* | *2nd Attempt* | *3rd Attempt* |
| Year | | | |
| Physics | | | |
| Chemistry | | | |
| Combined Mathematics | | | |
| Advanced Mathematics | | | |
| Index Number | | | |
| Z-Score | . | . | . |
| Medium Sinhala/Tamil/English (Delete whatever is inapplicable) | | | |
| Results of the year to be considered for Selection (indicate whether 2010 or 2011 or 2012 | | | |

04. School(s) attended from Year 11 to Year 13

| *Year* | *Name & Address of School* | *District* | *Period of Attendance* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | *From* | | | *To* | | |
| | | | *Year* | *M* | *D* | *Year* | *M* | *D* |
| 11 | | | | | | | | |
| 12 | | | | | | | | |
| 13  1st Attempt | | | | | | | | |
| 2nd Attempt | | | | | | | | |
| 3rd Attempt | | | | | | | | |

05.Certification of Results and Schools attended :

**It is compulsory to certify the results under No. 03 and details under No. 04 in the application by the School Principal for the School Candidates, and by a Justice of Peace for External Candidates.**

I certify that the particulars given above by the candidate in the cage No. 3 and No. 4 are true and accurate according to the Original Certificates.

Name of the Principal/Justice of the Peace :
Rev./Dr./Mr./Mrs. ...............................................................

Official Seal ...................... Signature ..................... Date

06. Field Preference :

SET 1 - Insert order of preference as 1 for First preference and 2 for Second preference. This should be completed only by the candidates who have applied for Maritime Studies.

SET 2 - Insert order of preference as 1, 2, 3, 4, 5, 6, 7. '1' for the "Most Preferred", '2' for the next and so on. '7' for the last preferred.

| *SET 1* | |
|---|---|
| *Maritime Fields* | *Order* |
| Marine Engineering Technology | |
| Nautical Studies and Technology | |

| State Priority, if applied for both SETS – ✓ | |
|---|---|
| SET 1 | |
| SET 2 | |

| *SET 2* | |
|---|---|
| *Other Fields* | *Order* |
| Chemical Engineering Technology | |
| Civil Engineering Technology | |
| Electrical Engineering Technology | |
| Electronic and Telecom-unication Engineering Technology | |
| Mechanical Engineering Technology | |
| Polymer Technology | |
| Textile & Clothing Technology | |

| | | |
|---|---|---|
| Are you registered as a fulltime student in any other University under the UGC (other than Open University) or any other Higher Educational Institution under the Ministry of Education ? (Delete whatever is inapplicable) | Yes | No |

*APPLICANT'S DECLARATION :*

(1) I declare that I am not a fulltime registered student at any University (except Open University of Sri Lanka) or any Higher Educational Institution under the Ministry of Education.

(2) I certify that all the particulars given by me in this Application are true and accurate. I am aware that if the

particulars given by me in this Application are found to be false or inaccurate prior to my admission, I will be discontinued from the course.

(3) In the event of my being selected for admission after the Test, I shall abide by the Statutes, By-Laws, Regulations and the Rules of the Institute of Technology, University of Moratuwa, in so far as they are applicable to me.

(4) I have pasted the cash deposit/ cash transfer receipt obtained from Bank of Ceylon, drawn in favour of "Institute of Technology, University of Moratuwa - Account No. 0000308280 of Bank of Ceylon, Katubadde Branch".

(5) I also enclose a self addressed stamped envelope (Rs. 40 worth) in size 9" x 4".

(6) I am aware that if I am found to be registered in another University or any other Higher Educational Institution under the Ministry of Education at the time of sitting for the Aptitude Test for the National Diploma in Technology Course, I will not be selected for the Course.

——————,
Signature of Applicant.

Date :—————.

| Paste your Cash Deposit/Cash Transfer Original Slip here. |
|---|

04-731

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ සිවිල්, යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු කාණ්ඩවලට අයත් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ (මින් මතු මෙහි "සේවය" යනුවෙන් හඳුන්වනු ලබන) තනතුරු අපේක්ෂා කරන සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙලක් නිශ්චය කර ගැනීමේ අරමුණ ඇතිව මෙම විභාගය 2013 අගෝස්තු මාසය තුළ හෝ/පසු එළැඹෙන දිනයක දී විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවෙකුට ඕනෑම මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර අයදුම්පතෙහි සඳහන් මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

03. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට, පත්කිරීම් බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

04. මෙම නිවේදනය අවසානයෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.05.27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2013" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

*සැ. යු.-*

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :- අයදුම්පතක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කරන පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර එවීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි ඉල්ලුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතු ය.

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

05. සුදුසුකම් :-

5.1 මෙම විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයෙකු -

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක එම කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ඇති වසර 04 ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාවක්, පත්කරනු ලැබීමට අයදුම්කරන ඉංජිනේරු කාණ්ඩයට අදාළ විෂය ධාරාවක් යටතේ සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබිය යුතුය.;

*නැතහොත්*

(ii) 5.1 (I) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලබන පාඨමාලාවක් අධ්‍යයන සහ අනිකුත් සියලු අවශ්‍යතා පත්කරනු ලැබීමට අයදුම්කරන ඉංජිනේරු කාණ්ඩයට අදාළ විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර, ඒ බව සනාථ කිරීමට වලංගු සහතිකය ලබා තිබිය යුතුය.

*සටහන* :- ඉහත සුදුසුකම් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5.2 වෙනත් සුදුසුකම් ඃ

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්කරු සුදුසුකම් සපුරා තිබිය යුතුයැයි බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ සඳහන් දිනට ඔහු/ඇය නියමිත සුදුසුකම් සෑම ආකාරයකින් ම සපුරා තිබිය යුතු ය.

iii. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

iv. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

v. ඉහත 5.1 යටතේ දැක්වෙන සුදුසුකම් සනාථ කෙරෙන සහතික නිකුත් කිරීමට පාදක වී ඇති සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනවල (Academic transcript) අඩංගු විෂයන්, බඳවා ගනු ලබන ඉංජිනේරු කාණ්ඩවල අවශ්‍යතාවලට සෑම අතින් ම අනුකූල විය යුතුය.

vi. වයස.—අවම සීමාව : අවුරුදු 21, උපරිම සීමාව : අවුරුදු 35, කෙසේ වෙතත් අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනට පූර්වාසන්න සේවයේ/තනතුරෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරියෙකුට (එනම් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියෙකුට) උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.

*සටහන.*—ඉහත සුදුසුකම් ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. *මාසික වැටුප් පරිමාණය.*—අදාළ වැටුප් පියවරයන්හි දී කාර්යක්ෂමතා කඩඉම් සහිතව රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555 යන මාසික වැටුප් පරිමාණය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව එස්එල් 1- 2006 වැටුප් පරිමාණය) මෙම තනතුරට හිමි වේ. කෙසේ වෙතත් බඳවා ගනු ලබන අවස්ථාවේ දී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබෙන හෝ බඳවා ගැනීමෙන් පසු පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගන්නා ඉංජිනේරුවරයෙකු සේවයේ II පන්තියේ II ශ්‍රේණියට හිමි පස්වන (05) වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

07. *සේවා කොන්දේසි* :

i. රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 509/07 දරන සහ 1988 ජුනි මස 07 වැනි දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තා වූ ද මින් මතු සිදුකරනු ලැබිය හැකි වූ ද සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

ii. පත්වීම් ලැබ වසර 05 ක් ඇතුළත 2007 මැයි මස 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

iii. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම්ලාභීන් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර පත් කිරීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

iv. පත්වීම්ලාභීන්, දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතු ය.

v. පත්වීම්ලාභීන් රාජ්‍ය සේවයේ මෙන්ම පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වේ.

vi. තමන් පත්කරනු ලබන තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා /හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින පත්වීම්ලාභීන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

vii. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරියෙකු බඳවා ගැනීමේ ශ්‍රේණියේ සිට ඊළඟ ශ්‍රේණියට උසස් කරනු ලැබීම සඳහා පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අනිවාර්ය අවශ්‍යතාවක් වේ.

08. *අයදුම්කිරීමේ ක්‍රමය* :

i. අයදුම්පත, අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අදහස් කරන මාධ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතු ය. විභාගයේ නම, සිංහල භාෂාවෙන් පුරවනු ලබන අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ භාෂාවෙන් පුරවනු ලබන අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. අයදුම්පත, එහි ශීර්ෂ අංක. 1.0 සිට 4.0 තෙක් පළමුවන පිටුවට ද 5.0 සිට 6.0 තෙක් දෙවන පිටුවට ද 7.0 සිට 10.0 තෙක් තුන්වන පිටුවට ද ශීර්ෂ අංක 11 හතරවැනි පිටුවට ද ගැනෙන සේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර, අයදුම්කරු විසින් අවශ්‍ය තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව එහි ඇතුළත් කළ යුතුය. තමා විසින් සම්පූර්ණ කරනු ලබන අයදුම්පත මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න අයදුම්කරු විසින් ම තහවුරු කරගත යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ii. අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,40,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

iii. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

iv. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ දින 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1,000 කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතු ය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත් ලදුපත, එහි දාරයකින්

අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ගාස්තු ආපසු ගෙවනු නො ලැබේ. නියමිත විභාග ගාස්තුව ඉහත සඳහන් පරිදි නොගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. *විභාග ක්‍රමවේදය* :

විභාගය ලකුණු 100 කින් සමන්විත ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට සීමා කරනු ලැබේ. ඉහත 5.1 හි සඳහන් සුදුසුකමක් ලබා ගැනීම සඳහා ඉංජිනේරු විද්‍යාව හැදෑරීම තුළින් ලබා ගත් දැනුම මත අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල බවත්, ඔහුගේ/ඇයගේ සිතෙහි විශ්ලේෂණ හැකියාවත්, ඔහුගේ/ඇයගේ තීරණ ගැනීමේ හැකියාවත් විනිශ්චය කිරීම අරමුණු කරගෙන මෙම විභාග ප්‍රශ්න පත්‍රය සැලසුම් කර ඇත. විභාග ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. ඒ සඳහා පැය 1 1/2 ක කාලයක් ලබා දේ. ඉහත විභාගයේ දී අපේක්ෂකයින් ලබා ගන්නා ලකුණු මත බඳවා ගැනීමේ අනුපිළිවෙල තීරණය කරනු ඇත.

11. විභාගයට ඇතුළත් වීම :

(i) අදාළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස අයදුම්පත් සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාගයට අදාළ ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම විභාගයට පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු නීති රීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවේ.

සටහන.—නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා ඇතැයි යන උපකල්පනය මත අයදුම්පත්‍ර යොමුකළ සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂියක් ලෙස නොසැලකිය යුතුය.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින විභාගය සම්බන්ධයෙන් ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින්, සෑම අපේක්ෂකයෙකු ම විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (පාස්පෝට් බලපත්‍රය).

13. සාවද්‍ය තොරතුරු සැපයීම.—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේත් නැත්නම් යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

14. *පත්කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය.*- තරග විභාගයෙන් ඉහළ ම ලකුණු ලබන අපේක්ෂකයින්ගේ සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ :-

i. අවම වශයෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ,

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර, එහි දී අපේක්ෂකයින්ගේ සහතිකපත්‍ර පරීක්ෂා කරනු ලැබේ,

iii. අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන/සහතික සෑම අතින් ම වලංගු ඒවා විය යුතුයි. නිසි බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක්/සහතිකයක් වලංගු නොවේ,

iv. ඉහත 14 (iii) හි සඳහන් සියලු වලංගු ලේඛන/සහතික සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුයි,

v. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ,

vi. අපේක්ෂකයින් කීප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

15. ලිඛිත විභාගයෙන් ලබාගත් ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ, ලේකම් විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු, විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත යැවීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

16. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ආමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013

Open Competitive Examination for Recruitment Engineers to the Grade II of Class II of the Sri Lanka Engineering Service - 2013

විභාගයට පෙනී සිටින මාධ්‍යය

| | |
|---|---|
| සිංහල | 2 |
| දෙමළ | 3 |
| ඉංග්‍රීසි | 4 |

අදාළ අංකය කොටුව තුළ ලියන්න

අයදුම්කරන කාණ්ඩය

| | |
|---|---|
| සිවිල් | 1 |
| යාන්ත්‍රික | 2 |
| විදුලි | 3 |

අදාළ අංකය කොටුව තුළ ලියන්න

1.0 නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr/Mrs/Miss :————.

උදා : Mr. SILVA, A. B.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම:————.
(ජාතික හැඳුනුම්පතෙහි සඳහන් භාෂාවෙන්

2.0 ජාතික හැඳුනුම්පත් අංකය

3.0 3.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.2 විභාග ප්‍රවේශ පත්‍ර යොමු කළ යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3.3 දුරකථන අංක : ස්ථාවර :————.
ජංගම :————.

3.4 තැපැල් නගරය :————.

3.5 විද්‍යුත් තැපැල :————.

4.0 4.1 ජන වර්ගය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(සිංහල - 1/දෙමළ - 2/ඉ. දෙමළ - 3/මුස්ලිම් - 4/වෙනත් - 5)

4.2 ස්ත්‍රී/පුරුෂ බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(පුරුෂ - 0, ස්ත්‍රී - 1)

4.3 විවාහක/අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(අවිවාහක - 1, විවාහක - 2)

4.4 උපන් දිනය : වර්ෂය මාසය දිනය

4.5 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

5.0

5.1 අධ්‍යාපන සුදුසුකම් :

i. උපාධිය හෝ *ගැසට්* නිවේදනයේ 5.1 (ii) ඡේදයේ සඳහන් සුදුසුකම් බල පැවැත්වෙන දිනය :————.
ii. විශ්ව විද්‍යාලය/ආයතනය :————.
iii. ලියාපදිංචි වූ අංකය සහ දිනය :————.
iv. පාඨමාලාවේ නම (*උදා* : විද්‍යාවේදී ඉංජිනේරු,Bsc Engineering) :————.
v. විෂය ධාරාව : (*උදා* : සිවිල්, යාන්ත්‍රික, විදුලි, නිෂ්පාදන)
vi. උපාධිය හෝ ගැසට් නිවේදනයේ 5.1 (II) ඡේදයේ සඳහන් සුදුසුකම හෝ සම්පූර්ණ කළ වසර :————.
vii. අවසාන වසරේ විෂයන් :————.
viii. විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

5.2 වෘත්තීය සුදුසුකම් (ලබා ඇත්නම්) (*උදා* : MICE, MIE) :————.

6.0 දැනට දරන තනතුර සහ පෙර දරන ලද තනතුරු ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

(සේවයට බැඳුනු දිනය හා ඉවත් වූ දිනයන් ද, එසේ ඉවත් වීමට හේතුන් ද සඳහන් කළ යුතුය)

6.1 තනතුර :————.
6.2 දෙපාර්තමේන්තුව/ආයතනය :————.
6.3 පත්වීම් දිනය :————.
6.4 ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලික ද යන වග :————.
6.5 තනතුර ස්ථිර කර තිබේ ද යන වග :————.
6.6 තනතුරේ වැටුප් පරිමානය සහ දැනට ලබන වැටුප :————.
6.7 පෙර දරන ලද තනතුරු පිළිබඳ විස්තර : (අමතර කොළයක් භාවිත කළ හැකිය) :————.
6.8 මෙහි සඳහන් කවර හෝ තනතුරක් දරන අතර ඔබ විනය දඬුවමකට භාජනය වී ඇති ද? :————.
එසේ නම් එම වරද සහ ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

7.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත් ද? එසේ නම් එම වරද සහ ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

8.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි එක් දාරයකින් මනා ලෙස අලවන්න.

(කුවිතාන්සියේ ඡායා පිටපතක් තමන් වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

කුවිතාන්සි අංකය :————.
ගෙවන ලද කාර්යාලය :————.
දිනය :————.

9.0 අයදුම්කරුගේ සහතිකය ෘ

මෙම අයදුම්පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් බව දනිමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 08 (ii) පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, මුදල් කුවිතාන්සිය අලවා ඇති බවත් ............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

11. අයදුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව ෘ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ............... දින ඔහුගේ/ඇයගේ ආදර්ශ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

ඉහත 06 වැනි ඡේදයේ නිලධාරියාගේ වර්තමාන සේවය පිළිබඳව දී ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම .............. බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන).

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

04-835

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.